**එක්සත් ජනපද - ශ්‍රී ලංකා ව්‍යාපාර කවුන්සිලයේ 5 වැනි මහා සභා රැස්වීමේදී ටෙප්ලිට්ස් තානාපතිතුමිය පලකළ අදහස්**

2021 ජූලි 22

සුභ සැන්දෑවක් මිත්‍රවරුනි, අසංක, පත්වීම වෙනුවෙන් ඔබටත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින්ටත් මාගේ ශුභාශිංසන පිරිනමනවා. මෙම වාර්ෂික මහා සභාවේදී තෙවන වරටත් ඔබ අමතන්නට අවස්ථාව ලැබීම මා අගය කරනවා. මාගේ අනුප්‍රාප්තිකයාගේ නාම යෝජනාව ඉදිරිපත් වී ඇති නිසා, මේ සභාවේ මා ඔබ අමතන අවසාන අවස්ථාව මෙය වියහැකි බව පවසන්නේ දුක්මුසුවයි. මාගේ පිටවයාම සහ ඇගේ පැමිණීම සඳහා තවම අපට දිනවකවානු තීරණය වී නැහැ. එක්සත් ජනපදයේ මේ සම්බන්ධයෙන් අප සපුරාලිය යුතු කාර්යපටිපාටිමය කරුණු තවමත් තිබෙන නිසා කාලවකවානු ගැන නිශ්චිතව කීම දුෂ්කරයි.

ගතවූ තුන් වසර ශ්‍රී ලංකාවට සිදුවීම් බහුල කාලයක් වූ බව ඔබ එකඟ වනවා ඇති, ඇත්තෙන්ම ශ්‍රී ලංකාවට පමණක් නොව සමස්ථ ලෝකයටම එසේයි. දේශපාලන කලබල, මැතිවරණ, සහ කුරිරු ත්‍රස්ත්‍ර ප්‍රහාරයක් මෙන්ම තවමත් පවතින වසංගත තත්වයක් ඇති වූවා. මේ සියළු අවස්ථාවන් මුළුල්ලේ එක්සත් ජනපදය තම හවුල්කාරීත්වයේ ඉහළ තත්ත්වයත්, ශ්‍රී ලංකාව සහ ශ්‍රී ලාංකික ජනතාව සමගින් ඇති සබඳතාවයත් විදහා පෙන්වා ඇති බව මගේ විශ්වාසය යි. උපකාර අවශ්‍ය වූ විට අප ප්‍රතිචාර දැක්වූවා, ව්‍යාපාර සහ අධ්‍යාපනය සඳහා පුද්ගලයින්ගේ සිට පුද්ගලයින් දක්වා වන සබඳතාවය පෝෂණය කරන්නට අප කටයුතු කළා. මෙම සම්බන්ධවීම අප සලකන්නේ අන්‍යොන්‍ය ප්‍රතිලාභ ලැබෙන සම්බන්ධතාවක් ලෙස මිස තනි පාර්ශවයකට වාසි හිමිවන සම්බන්ධතාවක් ලෙස නොවේ.

අපගේ ජනතාව අතරේ ඇති පොදු වටිනාකම් හා ක්‍රමෝපායික ලැදියාවන් මෙන්ම ස්ථිරසාර මිත්‍රත්වය පදනමක් කරගනිමින් මමත් මගේ කණ්ඩායමත් තිරසාරවූත් සර්වග්‍රාහිවූත් ආර්ථික වෘද්ධියක් පෝෂණය කිරීමට, ත්‍රස්තවාදය හා දේශසීමා අභිභවා යන අපරාධ මැඩලීමට, සහ නීතියේ ආධිපත්‍ය, විනිවිදභාවය හා ප්‍රජාතාන්ත්‍රික පාලනය ප්‍රවර්ධනයට ශ්‍රී ලංකාවේ ශක්‍යතාවය වර්ධනය කිරීම සඳහා විවිධ හවුල්කරුවන් සමගින් එක්වී වැඩ කර තිබෙනවා. ශ්‍රී ලංකා-එ.ජ. ව්‍යාපාර කවුන්සිලය ඒ අතරින් එක් හවුල්කරුවකු වනවා.

ආර්ථික වශයෙන් අප ලැබූ ජයග්‍රහණ මෙන්ම තවදුරටත් අප ඉදිරියේ ඇති අවස්ථා පිළිබඳව ආවර්ජනය කිරීමට මම සුළු මොහොතක් ලබාගන්නට කැමතියි.

පළමුව සහ ප්‍රධාන වශයෙන්ම මාගේ, එමෙන්ම මාගේ අනුප්‍රාප්තිකයාගේ ඉහළම ප්‍රමුඛතාවයක් වන්නේ මා කලින් සඳහන් කළ තේමා අනුව යමින් එ.ජ. සමාගම්වලට ශ්‍රී ලංකාව සමගින් සම්බන්ධවීමට ඇති අවස්ථා වර්ධනය කිරීමයි. භාණ්ඩ හා සේවාවන් අපනයනය කිරීමට, රජයේ ටෙන්ඩර් (නොපැහැදිලිය), හෝ ආයෝජන කිරීමට සහ මෙහි හවුල්කරුවන් සමගින් හවුල් ව්‍යාපාර සඳහා වේවා, ඒ සඳහා සහය ලබාදීමට අප සූදානම්.

ගත වූ තෙවසර තුළ අපගේ තානාපති කාර්යාලය බල ශක්තිය උත්පාදනයේ හා ජල කලමනාකරණයේ සිට දුම්රිය එන්ජින්, සෞඛ්‍ය සේවා නිපැයුම්, හා තොරතුරු තාක්ෂණය දක්වා විවිධ ක්ෂේත්‍රවල වාණිජ ලැදියාවන් සම්බන්ධයෙන් ඉහළ තත්ත්වයේ එ. ජ. සමාගම්

බොහොමයකට සහය ලබා දී තිබෙනවා. උගත් ශ්‍රම බලකායක් ඇති සහ ආර්ථික වශයෙන් ලෝකයේ වඩාත්ම ගතික කලාපය මධ්‍යයේ පිහිටා ඇති මෙරට සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික ආයෝජකයින්ගේ උනන්දුව මෑතකාලීනව අඩක් වී තිබෙනවා. නමුත්, මෙය මීට වඩා ඉහළ තත්වයකට ගෙන ආ හැකි බව මා දන්නවා, ඔබ එය දන්නා බවත් මා සිතනවා. බොහෝවිට මේ උනන්දුව සැබෑ වෙළඳ කටයුතු බවට පරිවර්තනය වන්නේ නැහැ, ඒවා සැබැවින්ම එලදරනු දකින්නට අපි කැමතියි.

ශ්‍රී ලංකාවේ සිදුකළ එ.ජ. ඍජු විදේශ ආයෝජන 2020 දී ඩොලර් මිලියන 13ක් වූ අතර, ඒ සමගින් මෙරට සිදුකළ සමුච්ඡිත ආයෝජන ප්‍රමාණය ඩොලර් මිලියන 274ක් වූවා. ගතවූ පස් වසර තුළ මෙම අගය සිත් දුර්මුඛ කෙරෙන ආකාරයෙන් එකම මට්ටමක තිබෙනවා, ඇත්තෙන්ම, එය සිත් දුර්මුඛ කෙරෙන කුඩා අගයක් වනවා. මෙම අගය මීට වඩා වැඩිකළ හැකියි කියා මට සිතෙනවා. රජයේ තීරණ ගැනීම්වල එකාකාරී ස්වරූපය සහ විනිවිදභාවය සම්බන්ධ කරුණු මීට ප්‍රධාන හේතුව වනවා. අන් හැමදෙයකටම වඩා ආයෝජකයින්ට අවශ්‍ය වන්නේ දෘෂ්‍යතාවයයි. එනිසා, ආයෝජනවලට හිතකර ප්‍රතිපත්ති වැදගත්වනවා වාගේම, නව රජයක් බලයට පත්වන වාරයක් පාසාම, පැවති උපායමාර්ග සියල්ලම ඉවත නොදැමිය යුතුයි. ශ්‍රී ලංකාවේ ආර්ථික සහ දේශපාලන අනාගතය සම්බන්ධයෙන් පොදු දැක්මක් වටා රටේ දේශපාලඥයින්, රජයේ නායකයින් සහ කර්මාන්ත එකට එක් වී, එය සාක්ෂාත් කරගැනීමට නිතර වෙනස් නොවන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍යයි.

නිතර වෙනස් නොවන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මෙම කාරණා ඔබලාත් පොදුවේ සැලකිල්ල යොමුකරන දෙයක් නිසා මා හිතන්නේ මෙය, ඔබ නොදන්නා දෙයක් මවිසින් සඳහන් කිරීමක් නොවේ, මා කියන්නේ ඉදිරියේදී වඩාත් වැඩි එකාකාර ස්වභාවයක් දැකීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමට අප කැමැත්තෙන් සහ සූදානමින් සිටින බවයි.

ඒවාගේම, මේ සම්බන්ධයෙන් අභිවෘද්ධියක් ලබාගැනීම කළහැකි දෙයක් බව මා දන්නවා. වෙස්ට් කෝස්ට් එනර්ජි සමාගමෙන් සියයට 40ක් සම්බන්ධයෙන් සම්මුති සාකච්ඡා පැවැත්වීමට මෑතකදී ඇමරිකානු සමාගමක් වන නිව් ෆෝට්‍රස් එනර්ජි සහ ශ්‍රී ලංකා රජය අතර ඇතිකරගත් රාමු එකඟතාවයෙන් මා ධෛර්යමත් වූවා. සුප්‍රකට එ.ජ. බලශක්ති සමාගමක් මෙරටේ බලශක්ති ක්ෂේත්‍රයේ ආයෝජන කිරීම ගෝලීය ආයෝජක ප්‍රජාවට යවන ප්‍රබල සහ ධනාත්මක සංඥාවක් වන අතර ශ්‍රී ලාංකික වෙළඳපලට වුවමනා කර තිබෙන ප්‍රාග්ධනය ගෙන ඒමට ඉන් හැකියාව ලැබෙනු ඇති.

තිරසාර සහ සර්වග්‍රාහී ආර්ථික වර්ධනය මාගේ දෙවන ප්‍රමුඛතාවය වන අතර වාණිජ සබඳතා නැමැති පළමු ප්‍රමුඛතාවය මත පදනම් වෙමින් මෙය ගොඩනැගෙනවා. මාගේ අත්දැකීම් අනුව, පාලනය සඳහා වඩාත් සර්වග්‍රාහී ප්‍රවේශයක්, මෙයින් මා අදහස් කරන්නේ යම් නිශ්චිත ආකාරයකට- එනම්, ප්‍රතිපත්ති සංවර්ධන අවධියේ දී රජයේ තීරණ ගන්නන් සමගින් සම්බන්ධවීම සඳහා පොදුවේ මහජනතාව සවිබල ගන්වන ප්‍රවේශයක්- යොදාගැනීම සඳහා පහසුකම් සැලසීමට ශ්‍රී ලංකාවට හැකියි.

අප නිතර වෙනස් නොවන ප්‍රතිපත්ති පිළිබඳ කථා කරනවා, එමෙන්ම, දැනුම්වත් ප්‍රතිපත්ති ද සැබැවින්ම උපකාරී වනවා. පුළුල් අදහස් විමසීමකින් තොරව ප්‍රතිපත්ති සම්පාදනය කිරීම තුළ එය තත්කාර්යවීමට, සහ අභිමතානුකූල වීමට පවා ඉඩ තිබෙනවා. මේ ක්‍රියාවලියට මහජනතාව ඇතුළත් කරගැනීම තුළින්, රජයේ ප්‍රතිපත්තිවල විශ්වසනීයත්වය වැඩිදියුණු

කෙරෙන අතර නවෝත්පාදනය, ප්‍රතිසංස්කරණ, සහ නව ප්‍රතිපත්ති ප්‍රවේශ සඳහා පිළිගැනීමක් ඇතිවනවා. මෙහිදී පැහැදිලිවම මහජනතාව අතරට ව්‍යාපාර අංශය ද ඇතුළත් වනවා.

පුළුල් ලෙස මහජන අදහස් ලබාගැනීම සහතික කෙරෙන පදනමකට පහසුකම් සැලසීම සහ එය කළමනාකරණය පහසු කටයුත්තක් නොවුනත් ප්‍රජාතන්ත්‍රවාදයක එය වැදගත් කටයුත්තක් වන අතර වඩාත් සමානාත්මතාවයෙන් යුත් හා පොදුවේ පිළිගැනෙන ප්‍රතිපත්ති තීරණ සඳහා එය හේතු විය හැකියි. අනෙකුත් මණ්ඩල ද සමගින් මේ ව්‍යාපාර කවුන්සිලය ද ප්‍රතිපත්ති සම්බන්ධයෙන් රජයට උපදේශනය කරන බව මා දන්නවා. ඉදිරියට ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය තුළ මේ ඇතැම් නිර්දේශ සහ යෝජනා පිළිගැනීමට ලක්වීමේ වැඩි ඉඩක් ඇතිවේයැයි මා ප්‍රාර්ථනා කරනවා.

තවමත්, ශ්‍රී ලංකාවෙන් අපනයන සිදුකරන විශාලතම තනි රට වන්නේ එක්සත් ජනපදය බැවින් ශ්‍රී ලංකාවේ සමෘද්ධිමත්භාවය වෙනුවෙන් මේ සම්බන්ධව අපගේ දායකත්වය කිසිවකුට සමකළ නොහැකියි. එමෙන්ම, ශ්‍රී ලංකාවේ සහ ඉන්දු-ශාන්තිකර කලාපයේ යටිතල පහසුකම් සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා එ.ජ. වෙළඳ සංවර්ධන නියෝජිතායතනයටත්, එ.ජ. සංවර්ධන මූල්‍ය සංස්ථාවටත්, USAID සහ අනෙකුත් නියෝජිතායතනවලටත් අප සැලකියයුතු සම්පත් ප්‍රමාණයක් යොමුකර තිබෙනවා.

DFC නොහොත් සංවර්ධන මූල්‍ය සංස්ථාව මේ වසර තුළ පමණක්, ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාරවලට තමන්ගේ වර්ධනය වෙනුවෙන් ප්‍රාග්ධනය කරා ප්‍රවේශ වියහැකිබව සහතික කරදීම සඳහා ශ්‍රී ලංකාවේ පෞද්ගලික බැංකුවලට අවශ්‍ය කරන මූල්‍ය සැපයීම වෙනුවෙන් ඩොලර් මිලියන 265ක් කැපකර තිබෙනවා. බොහෝ විට, වැඩි මහජන අවධානයක් ලැබෙන හා ආර්ථිකමය වශයෙන් විශ්වාසය තැබිය නොහැකි යටිතල පහසුකම් ව්‍යාපෘතිවලට වඩා, මෙවැනි මූල්‍ය සහය මගින් දීර්ඝ කාලීන තිරසාර සංවර්ධනයට වැඩියෙන් දායකත්වය ලබා දෙනවා. වඩාත් වැදගත් කාරණය නම්, මෙම ප්‍රවේශය තුළ රියැදුරු අසුනේ සිටින්නේ ශ්‍රී ලංකාව වීමයි.

වෘත්තීය පුහුණු ශක්තිමත් කිරීම, ශ්‍රම බලකායේ ශක්‍යතා වැඩිදියුණු කිරීම, තරුණයින් හා කාන්තාවන් තුළ ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය යනාදිය සඳහා වැඩකිරීම ඔස්සේ USAID වැඩසටහන් සර්වග්‍රාහී ආර්ථිකයක් සඳහා සහය ලබාදෙනවා. මෙතෙක් පැවති වැඩසටහන් හරහා 50,000කට අධික තරුණ පිරිසක් වෘත්තීය මාර්ගෝපදේශකත්වය සහ රැකියා ස්ථානගතකිරීම්වලින් ප්‍රතිලාභ ලබාගෙන තිබෙනවා. සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර, විශේෂයෙන්ම අවිධිමත් අංශයේ කාන්තාවන්ට හිමි ව්‍යාපාර ශක්තිමත් කිරීමට ද USAID සම්පත් යොමුකර තිබෙනවා. මෑතකාලීන ආර්ථික කම්පනවලින් වැඩියෙන්ම බලපෑමට ලක් වූ මෙම නිවෙස්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය නැවතත් යථා තත්වයට පත් කරගැනීමේදී සහ ඉදිරියේ දී විභවය වර්ධනය කරගැනීමේදි ඇත්තෙන්ම ඉතාමත් වැදගත් වනවා.

2020 දී USAID වැඩසටහන් කාන්තා හිමිකාරීත්වය සහිත ව්‍යාපාර 400 ඉක්මවන ප්‍රමාණයක් ඇති කිරීමට සහය ලබාදුන්නා. මේ පරිසරය තුළ පවා, ව්‍යාපාර 400ක් ආරම්භ කරනු ලැබුවා. DFC ණය හරහා ද ඉලක්ක කරන්නේ ශ්‍රී ලාංකික කාන්තවන්ට හිමි හෝ කාන්තා නායකත්වය සහිත කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර වන අතර ව්‍යාපාරවල නියුතු කාන්තාවන් සවිබල ගැන්වීම හරහා මෙම අරමුදල් මූල්‍ය සර්වග්‍රාහීබව ව්‍යාප්ත කිරීමටත්, ස්ත්‍රීපුරුෂ සමාජභාව අසමානතා මැඩලීමටත්, කාන්තා-නායකත්වයෙන් යුත් ව්‍යාපාර සඳහා සහය ලබාදීමටත් කටයුතු කරනු ඇති.

ඉතාමත් හොඳ තත්වයන් යටතේ පවා සර්වග්‍රාහී ආර්ථික වර්ධනයක් ඇතිකරගැනීම දුෂ්කර යැයි මා සිතනවා, එනිසා, මෙවැනි අනුකම්පා විරහිත වසංගතයක පසුබිමෙහි මෙය පැහැදිලිවම දුෂ්කර කටයුත්තක් වනවා. මා කලින් සඳහන් කළේ සුභ ප්‍රවෘත්තියක් වුවත් පවතින තත්වය තවමත් බොහෝ දුෂ්කර බව අපි දන්නවා.

වසංගතය හේතුවෙන් ඇතිවූ අලාභහානි මගින් මාස 18ක් තිස්සේ පීඩාවට ලක් වූ ශ්‍රී ලංකා ආර්ථිකය නැවතත් යථා තත්වයට ගෙන ඒම සඳහා මේ සියළුම ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ පමණක් නොව, මෙම වෛරසය ප්‍රබලව පරාජය කරදැමීම ද අවශ්‍ය වන බව ඔබ දන්නවා. ජූලි 16 වැනිදා, එනම් ගිය සතියේ සිකුරාදා, එක්සත් ජනපදය අපගේ ජාතික සම්පත්වලින් මොඩර්නා එන්නත් මාත්‍රා මිලියන 1.5ක් ශ්‍රී ලංකාවට ගෙනැවිත් භාර දුන්නා. එදිනම අපි ආර්ථිකය වඩාත් ආරක්ෂිතව නැවතත් විවෘත කිරීම සඳහා ඉඩ සලසමින් රෝග පරීක්ෂා හැකියාව ඉදිරියට පවත්වාගෙන යාමට ඉඩ ලබාදෙන්නා වූ කඩිනම් රෝග විනිශ්චය පරීක්ෂණ 500,000ක් ද ශ්‍රී ලංකාවට භාර දුන්නා. පොදුවේ ගත් කළ එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ කෝවිඩ් 19 ප්‍රතිචාරය සහ යථා තත්වයට පත්වීම සඳහා ඩොලර් මිලියන 8කට වැඩි ප්‍රමාණයක් ලබාදී තිබෙනවා. ජංගම වෙන්ටිලේටර්, ඇඟිලිතුඩු හරහා ඔක්සිජන් තත්වය මනින ඔක්සිමීටර්, සහ වෛද්‍ය කටයුතු සඳහා භාවිතයට සුදුසු උසස් තත්වයේ මුහුණු ආවරණ, ඇස් ආවරණ, සහ අනෙකුත් පුද්ගලාරක්ෂක උපකරණ ඊට ඇතුලත් වනවා.

කෝවිඩ්-19 මගින් ඇති වූ විනාශකාරී සහ පීඩාකාරී තත්වයෙන් නැවතත් යථාතත්වයට පත්වීම සඳහා ශ්‍රී ලංකාවටත් ලෝකයටත් සහය ලබාදීමට අප කැපවී සිටිනවා. සුරක්ෂිත, ඵලදායී සහ ඉහළ තත්ත්වයේ කෝවිඩ්-19 එන්නත් සඳහා සාධාරණ ප්‍රවේශයක් ලබාදෙන ගෝලීය මූලපිරීම වන කෝවැක්ස් වේදිකාව ඇති කිරීමට එක්සත් ජනපදය වසංගතය ආරම්භයේ දී ම ලෝක සෞඛ්‍ය සංවිධානය සහ අනෙකුත් ජාත්‍යන්තර හවුල්කරුවන් සමගින් අත්වැල් බැඳගත්තේ එනිසායි. ශ්‍රී ලංකාවට ලබාදුන් මාත්‍රා මිලියන 2කට ආසන්න ප්‍රමාණයක් ද ඇතුළුව කෝවැක්ස් හරහා මේ වනවිට විවිධ රටවල් 136කට එන්නත් මිලියන 121කට වඩා බෙදා දී තිබෙනවා. අපගේ ජාතික තොගයෙන් ශ්‍රී ලංකාවට එවූ එන්නත් මිලියන 1.5 ද මෙරටට එවනු ලැබුවේ එම කෝවැක්ස් යන්ත්‍රණය හරහායි.

2000 වසරේ දී එහි ආරම්භයේ පටන් ලොව වටා ළමුන් මිලියන 760ක් එන්නත්කරණය කළ රාජ්‍ය/පෞද්ගලික හවුල්කාරීත්වයක් වන Gavi සමගින් ද අප වැඩ කරනවා. ලොව වටා සාමාන්‍ය පරිදි සිදුකෙරෙන එන්නත්කරණ කටයුතු සඳහා සහ රෝග පැතිරීමේදී ප්‍රතිචර දැක්වීම සඳහා වාර්ෂිකව එන්නත් මාත්‍රා බිලියන දෙකකට වඩා ලබාගන්නා UNICEF සමගින් ද අප වැඩ කරන අතර, ඔවුන් ක්‍රියාත්මක වන රටවල කෝවිඩ් එන්නත් බෙදාහැරීම සඳහා ඔවුන් ද කටයුතු කරමින් සිටිනවා. ජාත්‍යන්තර සහයෝගීතාවයේත්, පරිත්‍යාගශීලීත්වයේත් වෛද්‍ය නවෝත්පාදනයේත් මෙම එකතුව මගින්, දිවි ගලවාගන්නා එන්නත් මිලදී ගැනීමට නොහැකි රටවලට තමන්ගේ පුරවැසියන් එන්නත්කරණය සඳහා හැකියාව ලබාදෙන බව සහතික කර තිබෙනවා.

සියළුදෙනාම කෝවිඩ්-19න් ආරක්ෂිත වනතෙක් කිසිම කෙනෙක් කෝවිඩ්-19න් ආරක්ෂිත නොවන බව අපට වැටහෙනවා.

අවසාන වශයෙන්, විනිවිදභාවයෙන් තොර, වගකීමෙන් තොර රාජ්‍ය ණය ගැනීම් මගහරවාගැනීමෙන් තම ආර්ථිකය ශක්තිමත් කරගැනීමට ප්‍රතිපත්ති පැනවීමටත් ජාත්‍යන්තර

යහපරිචයන්ට අනුකූලවන පරිදි මූල්‍ය ආයතන සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කිරීමටත් ශ්‍රී ලංකාවට සහය ලබාදීම, සර්වග්‍රාහී සහ තිරසාර ආර්ථික වර්ධනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමගින් අප කරගෙන යන වැඩකටයුතු අතර වඩාත් වැදගත් තැනක් ගන්නවා.

මේ අවස්ථාවේදී ශ්‍රී ලංකා ආර්ථිකය බරපතළ අභියෝගවලට මුහුණ දී ඇති බව රහසක් නොවේ. සංචිත පවත්වාගෙන යාමටත් ශ්‍රී ලංකාව තම ස්වෛරී පොරොන්දු සපුරාලන බව සහතික කිරීමටත් පෙර සූදානමකින් තොරව ක්‍රියාමාර්ග ගැනීම අවබෝධ කරගත හැකි නමුත්, එවන් තත්කාර්ය ක්‍රියාමාර්ග තවදුරටත් සාර්ථක නොවනු ඇති මට්ටමකට ළඟාවීම නුදුරේදීම සිදුවිය හැකියි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකයකු වශයෙන් ශ්‍රී ලංකාව හැකිතාක් වේලාසනින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමගින් සාධනීය ලෙස සම්බන්ධවීම අපගේ රජයෙන් නිර්දේශ කර ඇත්තේ එනිසායි. ශ්‍රී ලංකාව අභිමුව ඇති අභියෝග සඳහා පහසු පිළිතුරු නොමැති නමුත් අපගේ බයිඩන් ජනාධිපතිතුමා පැවසුවාක් මෙන් වඩාත් හොඳින් නැවතත් ගොඩනැංවීමට අවස්ථාවක් තිබෙනවා.

ඉදිරියට යාමට ගතහැකි වඩාත්ම හොඳ මාර්ගය සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීමට පහසුකම් සැලසීම සඳහා එක්සත් ජනපද භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව හරහා තාක්ෂණික සහය ලබාදීමට අපි කැපවී සිටිනවා. ප්‍රසම්පාදනයේ සිට, පරිසර ප්‍රතිපත්තිවල සිට මූල්‍ය යහපරිච සහ තවත් දැ දක්වා පුළුල් පරාසයක මාතෘකා සම්බන්ධයෙන් ජාත්‍යන්තර විශේෂඥයින්ට සහය ලබාදෙන්නට අපට හැකියි. මේ බොහෝ විෂයයන් සම්බන්ධයෙන් සැලකියයුතු විශේෂඥ දැනුමක් ඇති අය ශ්‍රී ලංකාවේ ද වාසය කරන බව මා දන්නා අතර ඔවුන්ගේ දැනුම රජයට ලබාදීම සඳහා දරන බොහෝ වෑයම් සඳහා ද අප සහය ලබාදෙනවා.

මේවා සම්බන්ධයෙන් සහ වෙනත් ප්‍රමුඛතා සම්බන්ධයෙන් ද, වඩාත් ශක්තිමත් ශ්‍රී ලංකාවක් සහ අප දෙරට අතරේ වඩාත් ශක්තිමත් සම්බන්ධතාවයක් ගොඩනංවාගැනීම සඳහා අපට එක්ව වැඩ කළහැකි අන්දම සම්බන්ධයෙන් ද අපගේ සාකච්ඡා ඉදිරියටත් ගෙනයාම සඳහා අප ඉත සිතින් සූදානම්.

සුරක්ෂිත සහ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් සඳහා එක්සත් ජනපදය කැපවී සිටිනවා. අපට පොදු ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් සහ ප්‍රතිමාන වෙත ශ්‍රී ලංකාවේ රජය සහ ජනතාව කැපවී සිටින තාක් අප සැමවිටකම ශ්‍රී ලංකාවේ හවුල්කරුවකු වීම සඳහා සූදානම්. ජාතික ප්‍රතිසන්ධානය සාර්ථක වීමට නම්, ඒ සඳහා ආයතනික රාමුවක් අවශ්‍ය කරන අතර, ප්‍රතිසන්ධානය වූ ශ්‍රී ලංකාවකට භේද දුරු කර, පුළුල්ව පැතිරුණු, සාධාරණ ආර්ථික වර්ධනයක් සාක්ෂාත් කරගත හැකි වනු ඇති. එවිට, එක්සත් ජනපදයට සිටින වඩාත් සංවර්ධිත හා සුරක්ෂිත හවුල්කරුවකු සහ ඉන්දු ශාන්තිකර කලාපයේ සාමය සහ ස්ථායිතාවය සඳහා වන උපස්ථම්භයක් වීමට ශ්‍රී ලංකාවට හැකිවනු ඇති අතර, වඩාත් වැදගත් කාරණය නම්, එවිට, මේ සුන්දර දිවයිනේ ජනතාව වෙත සමෘද්ධිමත්බව සහ සන්සුන්බව ගෙනදිය හැකි වනු ඇති.

ශ්‍රී ලංකාව කියන්නේ මහා විභවයක් තිබෙන අද්විතීය රටක්. අපට එක්ව වැඩකරන්නට පුළුවන් ධනාත්මක සහ උද්යෝගය ඇතිකරනසුළු අවස්ථා බොහෝ තිබෙනවා. ශ්‍රී ලංකා-එක්සත් ජනපද ව්‍යාපාර කවුන්සිලයෙන් ලැබෙන හවුල්කාරීත්වය සහ මිත්‍රත්වය මා අගය කරනවා. මෙම අවස්ථාවලින් ඵල නෙලාගැනීම පිළිබඳ උනන්දුවෙන් යුතුව බලාපොරොත්තුවනවා.

ස්තුතියි

####